# හන්තානට පායන සඳ

**කඳුළු එක්ක
ගනු දෙනු කරනා
මට - මගේ නො වන
ආදරයක් තිබුණා.........**



සිසිර දිසානායක

ඒ ආදරය ගැන සජීවීව අහන්න කාලය ආයෙමත් ඇවිත්. සමනල සංධ්වනියක රස මුසුව විඳගන්නට කාලය ආයෙමත් ඇවිත්. සම්මානනීය හඬ පෞර්ෂයක භාවයන් සමඟ කිමිදෙන්නට කාලය ආයෙමත් ඇවිත්. දාර්ශනික හඬ ගැඹුරක කිමිදෙන්නට කාලය ඇවිත්.

රාජ්‍ය සම්මානයයෙන් මතු නොව රසික සම්මානයෙන් පිදුම් ලද ගායනීය ගායන ශිල්පී විශාරද අමරසිරි පීරිස් සංගීතවේදියාණන්ගේ "හන්තානට පායන සඳ" මියැසි මේලාව මාර්තු තුන්වන සෙනසුරාදා සවස මෙල්බන් නුවර "බීසන් සෙන්ටර්" ශාලාවේදී වේදිකාගත වෙයි.

"මෙල්බන් නුවරට මම මේ එන්නේ හතරවෙනි වතාවට. කලින් ආව හැම වතාවකම රසික ප්‍රතිචාර ඉහළින් ම තිබුණා. ඒ වගේම ක්‍රමයෙන් ප්‍රතිචාර වැඩිවන ප්‍රවණතාවයකුත් තිබුණා. ඇත්තට ම මම ලෝකේ අනික් රටවල්වල පවත්වපු ප්‍රසංගවලදීත් ඒ ප්‍රවණතාවය දකින්න ලැබුණා. ඉතින් මම හිතනවා පසු ගිය වාරවලටත් වඩා හොඳ රසික ප්‍රතිචාරයක් මේ වාරේ ලැබෙයි කියලා....." ඒ අමරසිරි පීරිසුන් මව් බිමේ සිට දුරකථනයෙන්.

විශාරද අමරසිරි පීරිසුන් මෙවර මෙහි පැමිණෙන්නේ සිව්වන වතාවට. එනයින් රසිකයින්ට ඒ හඬ විඳින්නට අයෙමත් කාලය ඇවිත්. රසිකයින්ට ආයෙමත් විඳින්නට ලැබෙන්නේ සුපුරුදු ගී සමුච්-ඡයම දැයි සිතෙයි.

"නෑ. මේ වාරේ මම අළුත් ගීත ගණනා-වක්ම ගායනා කරන්න බලාපොරොත්තු වෙනවා. මේ ගීත වේදිකාවල වැඩිය නොගැයුණත්, අන්තර් ජාලයෙන්, ප්‍රජා මාධ්‍ය ජාලාවලින් රසිකයින් මේ ගීත අහලා හොඳ ප්‍රතිචාර දක්වලා තියෙනවා. ඒ අතරින් ඉහළට ම ප්‍රතිචාර ලැබුණ ගීත කීපයක් ම තෝරාගෙන තියෙනවා."

රසිකයින් පිළිබඳව දෙවරක් සිතන්නට අමරසිරි පීරිසුන් උනන්දු වී ඇති සේ ය. මේ වර්තමානයට පමණක් සීමා වූවක් නොවේ. මතු දවසක රසිකයන් වෙනුවෙන් තමන් දායාද කරන්නේ කුමන අන්දමේ නිර්මාණ ද, ඒවා වෙනුවෙන් තමන් සූදානම් වන්නේ කෙළෙසින් ද යන කාරණා පිළිබඳව විශාරද අමරසිරි  පීරිස් ගායන ශිල්පියා අතීතයේ දී දෙවරක් සිතා ඇති බව හැඟෙයි.

"මම මුලින්ම ශාස්ත්‍රීය සංගීතයයි ඉගෙන ගත්තේ. ඒ රජයේ සංගීත විද්‍යාලයෙන්. දැන් සෞන්දර්ය විශ්ව විද්‍යාලය බවට පත් වෙලා තියෙන්නේ ඒ ආයතනය. ඒක වසර හයක පාඨමාලාවක්. ගායනය වගේම වාදනයත් ඇතුලත්. මගේ ප්‍රධාන විශය වුණේ වයලීන වාදනය. නෙවිල් ජයවීර මහත්මයා ගුවන් විදුලියේ අධ්‍යක ධූරයේ ඉන්න කාලයේ සංගීත විද්‍යාලයේ පාඨමාලාව හදාරපු අය පරීක්ෂණයකින් තෝරාගෙන වාදක මණ්ඩලයට බඳවා ගත්තා. එහෙම තමයි වයලීන වාදකයෙක් විදියට කාලයක් වැඩ කරන්න ලැබුණේ."

"ඔය කාලදෙදි ම ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මහත්මයා එක්ක කටයුතු කළා. ඇත්තට ම ගායනයට මගේ වැඩි උනන්දුවක් තිබුණෙ නෑ. කේමදාස මාස්ටර්ගේ "පහන් තරුව" වැ-ඩසටහනකට වාදනය කරන්න ගිය වෙලාවක තමයි මාස්ටර් කිව්වේ "සින්දුවක් තියෙනවා; කියමු" කියලා. ඒ තමයි රන්බණ්ඩා සෙනෙවිරත්න මහත්මයා ලියලා තිබුණ " ළඳුනේ " ගීතය. පළවෙනි හඬකැවීමෙන් ම මාස්ටරුයි ශබ්ද පරිපාලනය කරපු මර්වින් බෙන්ස් මහත්තයයි සතුටු වුණා."

අනපේක්ෂිතව ගායන ශිල්පියෙක් බවට පත්වුණ අමරසිරි පීරිස් විශාරදවරයාට ඒ ගීතයෙන්ම තමන්ගේ අනන්‍යතාවක් ඇති වූ බව පෙනී යයි.

"ගුරු ගෙදර" චිත්‍රපටයට මම ගායනා කරපු පසුබිම් ගීතය ජනාධිපති සම්මාන ලැබුණා. ඇත්තට ම ඒ ගීය නිර්මලා රණතුංග විශා රදවරිය එක්ක ගායනා කරපු යුග ගීතයක්. ඒත් වැඩි දෙනෙක් අතරට ගියේ "සිරි මැදුර" චිත්‍රපටියට ගායනා කරපු "කන්‍යාවී" ගීතය. ලූෂන් බුලත්සිංහලයන් ලියලා කේමදාස මාස්ටර් සංගීතවත් කරපු මේ ගීතයටත් සම්මාන ලැබුණා. මේ ගීතය සම්පූර්ණයෙන් ම සිනමා රූපී නිර්මාණයක්."

ඉතින් මේ ගායනාත් එක්ක මම උනන්දු වුනා මගේ හඬ දියුණු කරගන්න. උත්තර භාරතීය සංගීතය ශාස්ත්‍රීයව හැදෑරුවත්, වෙනත් ක්‍රමවේද එක්ක එන අභ්‍යාස කරන්න මම උනන්දු වුණා. ඒ වගේම මගේ ම අත්හදා බැලීම් කළා. මම කර්ණාටක සංගීතය අහනවා. ඒ වගේ ම ජිම් රිව්ස්, ඒන්ජල් බර්ඩ්, හරිබිලා පන්ට්‍රි වගේ බටහිර සංගීතවේදීන්ගේ ගායනා අහනවා. ඉන්දියාවේ හිමිනේ ජෝෂි, මුකර්නාත් ටාකූර්, ෆයිස් ඛාන් වගේ සංගීතවේදීන්ගේ ගායනාත් අහනවා. "වෙද හාමිනේ " ටෙලි නාට්‍ය කරන කාලයේ ලංකාවට ඇවිත් හිටියා කළු අමෙරිකන් ජාතික "රොස්කෝ විලියම්ස් " ගායනා ශිල්පියා. ඔහු ලංකාවේ හිටිය වසර තුනක කාලයේ ඔහුගෙනුත් බටහිර ගායනා ක්‍රම හැදෑරුවා. ඒ වගේම ඩග්ලස් ෆර්ඩිනන්ඩස් මහත්මයාගෙන් බටහිර ක්‍රමයට වයලීන වාදනය හැදෑරුවා."



ඒ තමාගේ අනාගත රසික පිරිස වෙනුවෙන් විශාරද අමරසිරි පීරිසුන් සූදානම් වූ අන්දමයි. ප්‍රවීණයෙක් ලෙසින් රසිකයින් පිළිබඳව පීරිසුන් දෙවනුව ද සිතා බලනා බවට දරණ සාක්ෂියයි මේ.

"දැන් ඔය ප්‍රවීණයින්ට චෝදනාවක් තියෙනවානේ අළුත් පරපුරට අත හිත දෙන්නේ නෑ කියලා. අපි තේරුම් ගන්න ඕන ලෝකයේ හැම දෙයක් ම වෙනස් කොට ගීතයටත් වෙනසක් ඕන කියලා. ඉතින් අපිත් ටිකක් වෙනස් වෙලා, තරුණ පරපුරෙන් යම් හානියක් වෙන්න තියෙනවානම් ඒක අවම කරගන්න ඒ අය එක්ක එකතු වෙන්න ඕන. හොඳ ම උදාහරණය තමයි "ඔබ ඇපල් මලක් වාගේ " ගීතය. ඒක තාරුණ්‍යයට බො-හොම ළං වුණ ගීතයක්. වෙනම ම සංගීත රටා එක්ක ගීතය නිර්මාණය වුණත් ගියේ අගට රාගධාරී ශාස්ත්‍රීය සංගීතයේ ආකා රයට මම ආලාපයක් එකතු කළා. තනුව නිර්මාණය කරපු සංගීත් වික්‍රමසිංහ කිව්වෙත් ඒ නිසා ඒ ගීතය අමුතු ම ගීතයක් වුණා කියලා......."

අමරසිරි පීරිසුන්ගේ ගායනා අතර මෑතකදී තාරුණ්‍යයට ලඟා වූ ගීත ගණනාවක් ම වෙයි. ඒ ගීතත් සමඟින් මෙල්බන් හි වේදිකාගත වන "හන්තානට පායන සඳ" ප්‍රසංගය පිළිබඳව කෙටියෙන් වචනයක් පවසන්නට  පීරිසුන් අමතක කළේ නෑ.

මුලින් ම ස්තූතිවන්ත වෙන්න ඕන ප්‍රසංගය සංවිධානය කරන ශාන්ත ගමගේ මහත්මයා ඇතුළු පිරිසට. ඒ වගේම ඉන්ද්‍රජිත් මිරිහාන ඇතුළු ශිල්පීන් පිරිසට. ඉතින් හැමොටම අපි ආරාධනා කරනවා අපේ ගී විඳින්න එදාට අපි එක්ක එකතු වෙන්න කියලා."

අපිද අමරසිරි පීරිස් ශිල්පියානන්ට "සන්නස" පාඨකයින් වෙනුවෙන් ස්තූතිවන්ත වූයෙමු.

**"ගුරු ගෙදර" චිත්‍රපටයට මම ගායනා කරපු පසුබිම් ගීතය ජනාධිපති සම්මාන ලැබුණා. ඇත්තට ම ඒ ගීය නිර්මලා රණතුංග විශා රදවරිය එක්ක ගායනා කරපු යුග ගීතයක්. ඒත් වැඩි දෙනෙක් අතරට ගියේ " සිරි මැදුර" චිත්‍රපටියට ගායනා කරපු "කන්‍යා වී" ගීතය. ලූෂන් බුලත්සිංහලයන් ලියලා කේමදාස මාස්ටර් සංගීතවත් කරපු මේ ගීතයටත් සම්මාන ලැබුණා. මේ ගීතය සම්පූර්ණයෙන් ම සිනමා රූපී නිර්මාණයක්."**

## House for Sale

Nugegoda, Pagoda Road, Diyawanna Gardens

Two Story, 6 Bedrooms, 2 Kitchen areas, 2 Bathrooms
Build as two separate homes under one roof

Contact Aus. : 0433 197 930 / 0410 816 698
Sri Lanka : +94 112821448 / +94 77 785 1958